සියලු ම හිමිකම් ඇවිරිණි./ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 2024

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

I කොටස

• අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.

01. ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පොදුවේ සියලුම ජනතාවට ප්‍රයෝජනයට ගත හැකි වන සේ .............................................මගින් සපයන සේවා, පොදු සේවා වේ.
(පාසල/රජය/රජය හා පෞද්ගලික අංශය)

02. පොදු සේවා මහජනාව වෙත සැපයීම සඳහා රජය, ජනතාවගෙන් ලබා ගන්නා ............................... හා රජයේ වෙනත් ආදායම් යොදා ගනු ලැබේ.
(බදු මුදල්/නිෂ්පාදන/සේවා)

03. බෝ නොවන රෝග වැළැක්වීම අරමුණු කරගෙන ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා දිවයින පුරා ....................... පිහිටුවා, ක්‍රියාත්මක කර ඇත.
(දිවා සුරකුම් මධ්‍යස්ථාන/සුවදිවි මධ්‍යස්ථාන/සෞඛ්‍ය පෝෂණ සේවා මධ්‍යස්ථාන)

04. මානව සම්පතෙහි අභිවෘද්ධිය සහ යහපැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වන්නේ, ........................ යි.
(අධ්‍යාපනය/ප්‍රවාහනය/සන්නිවේදනය)

05. ඔබගේ ප්‍රදේශයේ නීතිය හා සාමය සුරකීම හා මහජන ආරක්ෂාව සැපයීම ......................ප්‍රධාන කාර්යභාරය වේ.
(අධිකරණයේ/පොලීසියේ/ශ්‍රී ලංකා නාවික හමුදාවේ)

• ප්‍රශ්ණ අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද, වැරදි නම් වැරදි (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. පොදු සේවා සපයන ආයතන තම යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීම ජනතාවට ගුණාත්මක සේවා සැපයීමට හේතු වේ. ( )

07. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් මෙන් ම ජීවන ක්‍රමයක් ද වේ. ( )

08. සාකච්ඡා නොකර තීරණ වලට එළඹීම පවුල තුළ දැකිය හැකි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණය කි. ( )

09. සෑම පුද්ගලයෙකුම උත්සාහ කළ යුත්තේ තමාට හා සමාජයට වඩාත් ප්‍රයෝජනවත් ජීවන අරමුණු, ඉලක්ක කරා ළඟා වීමට යි. ( )

10. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පූර්විකාවකින් හා වගන්ති 45කින් සමන්විත වේ ( )

● ප්‍රශ්ණ අංක 11-15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. "සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නා වූත්, ලබා ගන්නා වූත්, දැනුම, විශ්වාසය, කලා, සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය, සංස්කෘතිය යි" ලෙස ඉහත සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කළේ,

1. ඊ.බී. ටයිලර් 3. චාල්ස්. ඒ. එල්වුඩ්

2. මහාචාර්ය විමල් දිසානායක 4. ඒබ්‍රහම් ලින්කන්

12. ශ්‍රී ලංකාවේ දැනට වැඩිම ජනගහනයක් අදහන ආගම වනුයේ,

1. හින්දු 3. ඉස්ලාම්

2. බෞද්ධ 4. ක්‍රිස්තියානි/කතෝලික

13. ඇමරිකා එක්සත් ජනපදයේ ජීවත් වන ජනවර්ගයක් වන්නේ,

1. දෙමළ 3. මුන්ඩා

2. මරාති 4. රතු ඉන්දියානුවන්

14. මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සැලකෙන්නේ

1. මක්කම 3. ඉතාලිය

2. ශ්‍රී පාද භූමිය 4. ජෙරුසලම

15. ජාතික සමගිය හා තිරසර සාමය ගොඩනගා ගැනීමේ වාසික් නොවන්නේ,

1. ජනකොටස් අතර සමගිය වර්ධනය වේ 3. ගැටුම් අවම වේ

2. එකමුතුව හා සාමූහිකව කටයුතු කරයි 4. සංස්කෘතික විවිධත්වයට ගරු නොකිරීම

● අංක 16 - 20 දක්වා A හා B තීරු දෙකේ සම්බන්ධතාව තේරුම් ගෙන යා කරන්න.

| A | B |
|---|---|
| 16. ප්‍රශ්න වලට සවන්දීම හා විසඳීම | ළමයින් සඳහා හිමිවිය යුතු අයිතිවාසිකමක් |
| 17. සුනාමි | දූෂිත නායකත්ව ශෛලියේ එක් ලක්ෂයකි |
| 18. සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම | ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියේ ලක්ෂණයකි |
| 19. පෞද්ගලිකත්වයට වැඩි නැඹුරුවක් දැක්වීම | කාලගුණික හා දේශගුණික විපර්යාස නිසා ඇති වන විපතකි |
| 20. ගංවතුර | පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලියක් නිසා හටගත් විපතකි |

(ලකුණු 20x2 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. i පොදු සේවා 02ක් නම් කරන්න . (ල 2)
   ii සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය මගින් ඔබ ප්‍රදේශයට ඉටු කරන සේවා 02ක් නම් කරන්න. (ල 2)
   iii නිදහස් අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හදුන්වා දීමේ ගෞරවය හිමිවන්නේ කාටද? (ල 2)
   iv සමූපකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය කුමක්ද? (ල 2)
   v ළමා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආයතන 02ක් නම් කරන්න. (ල 2)
   vi ස්වාභාවික විපත් 2ක් නම් කරන්න. (ල 2)
   vii ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් බස් ඩිපෝවක සේවා සැපයීම සඳහා දායක වන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)
   viii ආරක්ෂක අංශ මගින් මහජනතාව වෙත සපයන සේවා 02ක් සඳහන් කරන්න. (ල 2)

(ලකුණු 2x8 = 16)

2.

A  B 

I ඉහත රූප සටහන මගින් නිරූපණය වන චිත්තවේග හදුනාගෙන නම් කරන්න. (ල 2)
II ඔබ නම් කල A රූපසටහනට අදාල චිත්තවේගයට ඔබ දක්වන පතික්‍රියා 03ක් ලියන්න. (ල 3)
III ඔබ නම් කල B රූප සටහනට අදාල චිත්තවේගය ඇති වූ පසු එය සමනය කිරීමට කල හැකි ක්‍රියාකාරකම් 03ක් ලියන්න. (ල 3)
IV පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් යහපත් අයුරින් චිත්තවේග පාලනය කරගත යුත්තේ ඇයි? කරුණු 3ක් දක්වන්න. (ල 3)

3. I පවුල තුළ සාමාජිකයන් එක්ව කටයුතු කරන අවස්ථා 2ක් නම් කරන්න. (ල 2)
II ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක් හුරු කිරීම සඳහා පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් 03ක් ලියන්න. (ල 3)
III වර්තමාන සමාජය තුළ ළමයින්ට මුහුණ දීමට සිදුවන ගැටලු 3ක් සඳහන් කරන්න. (ල 3)
IV ඉහත 3 III ප්‍රශ්නයේදී සඳහන් කළ පාසල මගින් ක්‍රියාත්මක කරන විෂය සමගාමී ක්‍රියාකාරකම් තුළින් ශිෂ්‍යයා ලබා ගන්නා ප්‍රයෝජන 3ක් ලියන්න. (ල 3)

4. I පහත දැක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් 4යි. ඒ එක් එක් සංස්කෘති අයත් ආගමිකයින් සමරන උත්සවය බැගින් ලියන්න.

i බෞද්ධ සංස්කෘතිය - ...............................
ii හින්දු සංස්කෘතිය - ...............................
iii ඉස්ලාම් සංස්කෘතිය - ...............................
iv ක්‍රිස්තියානි සංස්කෘතිය - ............................... (ල 4)

II ඉන්දියාව තුළ ජීවත් වන ජනවර්ග 03ක් නම් කරන්න. (ල 3)

III ඔහු සංස්කෘතික රටක් ලෙස කටයුතු කිරීමේ දී ඇමරිකාව විසින් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග 02ක් සඳහන් කරන්න. (ල 4)

5. I බහු සංස්කෘතියක් පවතින රටවල් 02ක් නම් කරන්න. (ල 2)


II



A



B



C



D

ඉහත රූප සටහන් හොඳින් නිරීක්ෂණය කර නම් කරන්න. (ල 4)

A -

B -

C -

D -

III බහු සංස්කෘතික සමාජයක දැකිය හැකි ලක්ෂණ 3ක් නම් කරන්න. (ල 3)

IV "සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා කර ගනිමින් ජාතික සමගිය ගොඩනගා ගැනීම වැදගත් වේ" ඉහත ප්‍රකාශය සනාථ කිරීමට කරුණු 3ක් දක්වන්න. (ල 3)

6.





I ඉහත A හා B රූප සටහන් හඳුනා ගෙන නම් කරන්න. (ල 2)

II ඉහත A රූපයෙන් දැක්වෙන විපත් අවස්ථාව ඇති වීම සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකම් 03 ලියන්න (ල 3)

III ඉහත B රූපයෙන් දැක්වෙන විපත් අවස්ථාව ඇති වීම සඳහා බලපාන රියදුරන් අතින් සිදුවන වැරදි 03ක් දක්වන්න (ල 3)

IV අනතුරු හා ආපදා අවස්ථා වලදී සහය ලබා ගත හැකි ආයතන 3 නම් කරන්න. (ල 3)

7. I රසායනික ද්‍රව්‍ය ශරීර ගත විය හැකි ක්‍රම 2ක් ලියන්න. (ල 2)

II පළිබෝධනාශක භාවිතය නිසා මිනිසාට හා පරිසරයට සිදුවන හානි 3ක් ලියන්න. (ල 3)

III රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා වන අනතුරු වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග 3ක් සඳහන් කරන්න. (ල 3)

IV "දැරිය හැකි ජීවන රටාවකට හුරුවීම, තිරසර සංවර්ධනයේ මූලිකම තේමාවයි". ඉහත ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 3)

සියලු ම හිමිකම් ඇවිරිණි./ All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 08 2024

## පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

### I කොටස

01. පවුල
02. ව්‍යාප්ත පවුල
03. අරමුණු
04. ආත්මාවබෝධය
05. අයිතිවාසිකම්
06. √
07. X
08. X
09. √
10. X
11. IV
12. III
13. II
14. II
15. III
16. A - කෘෂිකාර්මික
    D - ධීවරකර්මාන්ත
17. වී වෙළඳාම/සහල් වෙළඳාම
    සහල් කොටන මෝල්, වී කොටන මෝල් පවත්වාගෙන යාම
18. මාලු ඇල්ලීම, මාලු වෙළඳාම, කරවල වෙළඳාම
19. පොහොර මිල වැඩිවීම/නියග තත්ත්ව ඇතිවීම/සී සෑමට, ගොයම් කැපීමට පෑගීමට වියදම් අධික වීම. (අදාළ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න)
20. පොහොර සහනාධාරය, වැව් අමුණු ඉදිකිරීම, සීමා ප්‍රතිසංස්කරණය කිරීම, ඇළ මාර්ග ඉදිකිරීම. (අදාළ නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න)

### II කොටස

1. I * ඥාතිත්වය මත ගොඩනැගී තිබීම.
   * සාමාජිකයන් එක් වාසස්ථානයක ජීවත් වීම.
   * සාමාජිකයන් අතර සමීප සබඳතා පැවතීම. (පිටු අංකය 5)

   II සුහදශීලී බව/අවංක බව/ස්වයං විනය/අන්‍ය මත ගරු කිරීම (පිටුව 14)

   III දිනපතා පාසල් යාම/ගුරුවරුන්ට කීකරුවීම/ගුරු උපදෙස් පිළිපැදීම (අදාල නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න) (පිටුව 7)

   IV A - බෞද්ධ B - හින්දු
   C - කතෝලික D - ඉස්ලාම්

   V පුස්තක කාල / ප්‍රජා සංවර්ධන සමිති (පිටු 20)

   VI ශාරීරික හා මානසික දුබලතා ඇතිවීම/පිලිකා වැනි මාරාන්තික රෝග වැළඳීම/උපයන ධනය විනාශ වීම/ පවුල් ආරවුල් ඇතිවීම/පව්පිය දූ දරු සබඳතා දුරස්වීම (නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න)

2. I A - ක්‍රීඩාවක යෙදෙන සිසුන් පිරිසක්
   B - සෞන්දර්ය ක්‍රියාකාරකමක යෙදෙන දරුවෙක් (බට නලාවක් පිඹින දරුවෙක්)

   II ජය පරාජය සතුටින් විඳගැනීම/විධාන පිළිපැදීම/නීති ගරුක වීම/වින්දනය හා සතුට (පිටුව 22)

   III තුවාලවීම්/සීරීම්/අස්ථි බිඳීම්/ක්ලාන්ත වීම් (නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න)

IV විනෝදය/වින්දනය/චිත්තවේග පාලනය/සංයමයෙන් යුතුව යමක් ප්‍රකාශ කළ හැකිවීම (පිටුව 23)

3. I දෙමාපිය ආදරය සෙනෙහස ලැබීම } දෙමාපියන්ට වැඩිහිටියන්ට ආදරය සෙනෙහස ඇතිවීම/කීකරු වීම/ ගරු කිරීම/සිරිත් විරිත් සංස්කෘතිය ආරක්ෂා කිරීම.

අධ්‍යාපනය ලැබීම } හොඳින් ඉගෙන ගැනීම./උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල නිරතවීම/ ඔවුන්ගේ උපදෙස් පිළිපැදීම/ගුරුවරුන්ට කීකරු වීම

(නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.)

II සරල දිවි පැවැත්ම/පරාර්ථකාමී බව/ඉවසීම/සුහදශීලී බව/පොදු දේපල ආරක්ෂා කිරීම/සහයෝගයෙන් කටයුතු කිරීම. (පිටුව 38)

III වැඩිහිටි ඥාතීන්ගෙන් පාරම්පරික සිරිත් විරිත් සම්ප්‍රදායන් පිළිබඳ දැනුම ලැබීම/පරපුරෙන් පරපුරට ඒවා දායාද වීම/සමගියෙන් කටයුතු කිරීම/සාමූහිකත්වය වර්ධනය වීම (පිටුව 41)

4. I දිනපතා මල් පහන් පූජා කිරීම/ නිවසින් බැහැර යන විට දෙමාපියන්ට වැඳීම/පවුලේ සාමාජිකයින් එක්ව ආහාර ගැනීම/ඥාතීන්ගේ නිවෙස්වලට බැලීමට යාම (පිටුව 43)

II ශ්‍රමදාන/ආගමික උත්සව වලදී/අවමගුල් අවස්ථා/කුඹුරු වැඩ (පිටුව 44)

III අනිසිලෙස කැලිකසල බැහැර කිරීම/අධික ශබ්ද නිකුත් වන රූපවාහිනිය/ගුවන්විදුලිය ආදී උපකරණ භාවිතය/නීත්‍යානුකූල නොවන ක්‍රියාවල යෙදීම/සාද පැවැත්වීම (නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න)

5. I ග්‍රාම සංවර්ධන/ ක්‍රීඩා/මරණාධාර (පෙළ පොත 52 පිටුව)

II පෙළපොත 53 පිටුව හා සිසුන් ලියන ලද අදාල නිවැරදි පිළිතුරුවලට ලකුණු දෙන්න.

III සිසු දරුවන් මැනවින් හික්ම වීම/දරුවන්ගේ හැකියා දක්ෂතා/විභවිතා මැනවින් හඳුනා ගැනීම/අවශ්‍ය මග පෙන්වීම/ හොඳින් අධ්‍යාපනය ලබාදීම.

6. I සමාජය තුළින්ම හිමි වේ/ සමාජයේ පොදු යහපත සමග එකට බැඳේ/අසීමිත නොවී පවතියි (පිටුව 60)

II සිවිල් - B,C,F
දේශපාලන - A,D,E

III පෞද්ගලික අයිතිය හා නිදහස ආරක්ෂා වීම.
ජනතා අවශ්‍යතා ඉටුවීම.
යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය වීම.
යහපත් ජීවන ක්‍රමයක් ගොඩනගාගත හැකි වීම.
ශිෂ්ට සම්පන්න සමාජයක් බිහිවීම.

7. I රජයට අවනත වීම/නිතර පිළිපැදීම/ බදු ගෙවීම. (පිටුව 72)

II දෙමාපියන්ට සැලකීම/වැඩිහිටියන්ට සැලකීම,ගරු කිරීම/ආචාර ශිලී වීම/ ගුරුවරුන්ට ගරු කිරීම (පිටුව 72)

III පවුලෙන් පැවරී ඇති වගකීම් :-
* දෙමාපියන් සොයන ධනය ආරක්ෂා කරගනිමින් වියදම් කිරීම.
* කුඩා සහෝදර සහෝදරියන් බලා ගැනීම, ආරක්ෂා කිරීම.
* පවුලේ සෙසු ඥාතීන් ආරක්ෂා කිරීම.
* පවුලේ ඥාතීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම ආදී අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.
පාසලෙන් පැවරී ඇති වගකීම් :-
* පාසලේ නීති රීති පිළිපැදීම හා ඒවාට ගරු කිරීම.
* පාසල හා දේපළ ආරක්ෂා කර ගැනීම.
* ගුරු සිසු සබඳතාව හොඳින් පවත්වාගෙන යාම.
* සිසුන් අතර සමගියෙන් සහයෝගයෙන් කටයුතු කිරීම.
* පාසැල් භූමිය පවිත්‍රව තබාගැනීම, ආරක්ෂා කරගැනීම ආදී අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙන්න.